රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 3000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**SOC 32663** - සමාජ ගැටලු

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. සමාජ ගැටලුවක් යනු කුමක් දැ යි නිර්වචනය කොට එ වැන්නක් අධ්‍යයනය කළ හැකි එක් දර්ශනපථයක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

02. සියදිවි නසාගැනීම පිළිබඳ දුර්කයිම්ගේ පැහැදිලි කිරීම විවේචනාත්මක ව විග්‍රහ කරන්න.

03. "බොහෝ සමාජ ගැටලුවල විෂය පථය ජාත්‍යන්තර වේ." මත්ද්‍රව්‍ය ගැටලුව ආශ්‍රයෙන් මේ කියමනෙහි වලංගුතාව පරීක්ෂා කරන්න.

04. සමාජ ගැටලු හා සමකාලීන පවුල් සංස්ථාව අතර සම්බන්ධතාව ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද?

05. "අද්‍යතන ශ්‍රී ලංකාව මුහුණ දෙන සමාජ ගැටලු අතර 'වියපත්වීම' ද විශේෂ අවධානයට ලක් වී තිබේ." උක්ත ප්‍රකාශයේ වලංගුතාවක් තිබේ දැ යි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

06. කාන්තාවන් විදේශ ගෘහ සේවයේ යෙදීම ශ්‍රී ලංකාවේ සමාජ ගැටලුවල තීව්‍රතාව සමනය කිරීමට හෝ නැතහොත් උද්දීපනය කිරීමට හේතුවක් වී තිබේ දැ යි පරීක්ෂා කරන්න.

07. 'දිළිඳුබව', ශ්‍රී ලංකාව මුහුණ දෙන සමාජ ගැටලුවක් වශයෙන් ඔබ දකින්නෙහි ද? එය පිටු දැකීම සඳහා ගත් උත්සාහයන්හි සාර්ථක -අසාර්ථකභාවය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

08. ජනවාර්ගික අර්බුදයක් රට තුළ පැවතීම, අදාළ රටෙහි සංවර්ධන ක්‍රියාවලිය කෙරෙහි බලපෑ හැකි ආකාරය ශ්‍රී ලංකාවේ පැවති ජනවාර්ගික ගැටුම ඇසුරින් සාකච්ඡා කරන්න.

@@@@@@@@@

219